සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය

**8 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

නම/ විභාග අංකයඃ

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 - 05 දක්වා වූ ප්‍රකාශන හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

01 සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සියල්ල සූර්යයා වටා ඉලිප්සාකාර මාර්ගවල ගමන් කරන බවට තොරතුරු ඉදිරිපත් කළේ ජොහැන්නස් කෙප්ලර්ය. ( )

02 බර්තොලමියුදියෙස් නම් පෘතුගීසි ජාතිකයා ඉන්දියාවේ කැලිකට් වරාය දක්වා පැමිණියේ ය. ( )

03 දොන් ජුවන් ධර්මපාල රජතුමාගේ මරණයත් සමගම 1597 සිට උඩරට රාජධානිය පෘතුගීසීන් අතට පත්විය. ( )

04 ජෝන් ගටෙන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය නිපදවීමත් සමගම පොත්-පත් සුලභ වී අදහස් වේගයෙන් පැතිරෙන්නට විය. ( )

05 පිළිමතලව්වේ මහ අධිකාරම ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට විරුද්ධව කැරලි ගසා ඉංග්‍රීසීන් වෙතට පලා ගියේ ය. ( )

- ගැළපෙන වචන යොදා පහත අංක 06 - 10 දක්වා වූ ප්‍රකාශනවල හිස්තැන් පුරවන්න.

06 පළමුවන විමලධර්මසූරිය රජතුමා 1594 දී .......................................... සටනින් පෘතුගීසීන් අන්ත පරාජයට පත් කළේය.

07 උඩරට රාජධානියේ පැවැති පාලන ක්‍රමය අනුව රටේ සියලුම කටයුතුවල ප්‍රධානියා වූයේ ............................................................ ය.

08 සිංහල රජ පරපුරේ අන්තිමයා වූයේ ............................................................ රජතුමා ය.

09 මහනුවර නගරයේ දෙමහල් දළදා මාළිගයක් තනවා එහි දළදා වහන්සේ තැන්පත්

කිරීමට .................................................... රජතුමා ක්‍රියා කළේය.

10 ''අවසාන රාත්‍රී භෝජනය'' නම් චිත්‍රය ......................................................... ගේ නිර්මාණයකි.

- අංක 11 - 15 දක්වා වූ ප්‍රකාශන සඳහා වරහන් තුළ දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11 බ්‍රහස්පති ග්‍රහයාට උප ග්‍රහයින් රාශියක් ඇති බව සොයාගන්නා ලද්දේ ............................... විසිනි. (නිකලස් කොපර්නිකස් / අයිසෙක් නිව්ටන් / ගැලීලියෝ ගැලීලි)

12 හත්වන බුවනෙකබාහු රජතුමා තමාගෙන් පසුව තම රාජ්‍යය මුණුපුරා වන ................................................ කුමරුට පවරා දුනි. (ධර්මපාල / දේවරාජ / වික්‍රමබාහු)

13 පෘතුගීසීන්ගේ පෙරදිග මූලස්ථානය ඉන්දියාවේ ............................................. පිහිටා තිබුණි. (කැලිකට්හි / ගෝවේ / මදුරාසියේ)

14 ජෙරනිමෝ ද අසවේදු 1597 දී ............................... පැවැති රැස්වීමේ දී සිංහල සිරිත්-විරිත් අනුව කෝට්ටේ රාජ්‍යය පාලනය කිරීමට එකඟ විය. (කෝට්ටේ / මල්වානේ / ගාල්ලේ)

15 උඩරට රාජධානියේ අලි-ඇතුන්ගෙන් අයකළ බද්ද .......................................... නම් විය. (මඩිගෙ බද්ද / බඩහැල බද්ද / කුරුවේ බද්ද)

- A තීරුවේ සඳහන් පුද්ගලයින් හා ගැළපෙන සිදුවීම් B තීරුවෙන් තෝරා යා කරන්න.

| A | | B | |
|---|---|---|---|
| 16 | උඩරට රාජධානිය අත්-පත් කරගැනීමට ක්‍රියා කළේය. | A | ටිකිරි බණ්ඩාර |
| 17 | සියම් දේශයෙන් උපසම්පදාව ගෙන්වා බුදු සසුනේ දියුණුවට කටයුතු කළේය. | B | ප්ලොරන්ස් |
| 18 | මුල්ලේරියා වෙලේ සටනින් පෘතුගීසීන් අන්ත පරාජයට පත් කළේය. | C | ප්‍රැන්සිස් බේකන් |
| 19 | පුනරුද යුගයේ කලා කටයුතු සම්බන්ධයෙන් | D | රොබට් බ්‍රවුන්රිග් |
| | | E | කීර්ති ශ්‍රී රාජසිංහ |

(2 x 20 = 40)

The National e-learning Portal for The General Education

වැදගත් විය.

20 ඉංග්‍රීසි සාහිත්‍යයේ පහන් තරුවයි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමි වේ.**

01 (i) දෙවන වාරය තුළ ඉතිහාසය විෂයය සම්බන්ධව ඔබේ පන්ති කාමරයේ ක්‍රියාත්මක කළ ඇගැයීම කුමක් ද?

(ii) ඒ සඳහා යොදාගත් පාඩම් මාතෘකාව කුමක් ද?

(iii) ඔබ එම ඇගැයීමට සම්බන්ධවීම සඳහා ඉටුකළ කාර්යය කුමක් ද?

(iv) එම ඇගැයීම සඳහා සකස් කළ ප්‍රශ්න 2 ක් ලියන්න.

(v) මෙම ක්‍රියාකාරකමට සහභාගී වීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජනයක් ලියන්න.

(vi) නිර්මාණය අවසන් වශයෙන් නිමකළ ආකාරය සඳහන් කරන්න.

(vii) අවශ්‍ය ද්‍රව්‍ය සපයාගැනීමට අනුගමනය කළ ක්‍රමය කුමක් ද?

(viii) ඔබගේ නිර්මාණයේ පැවැති ඔබ හඳුනාගත් දුර්වලතාවයක් ලියන්න.

02 (i) පෙරදිග රටවලට පැමිණ වෙළඳ ද්‍රව්‍ය ලබාගැනීමට ක්‍රියාකළ යුරෝපා ජාතීන් 2 ක් ඔවුන්ගේ මව් රටවල් ද සමග නම් කරන්න.

(ii) ඔවුන් වෙළඳ ද්‍රව්‍ය ලබාගත් පෙරදිග රටවල් 4 ක් ලියන්න.

(iii) (a) පෘතුගීසීන් මෙහි පැමිණෙන විට ශ්‍රී ලංකාව බෙදී තිබූ පාලන ඒකක මොනවා ද?

(b) ඒවායේ පාලකයින් ද නම් කරන්න.

03 (i) විජයබා කොල්ලය යන සිදුවීම ගැන ඔබ දන්නා කරුණු (

(ii) දකුණු පස ඇති ශ්‍රී ලංකා සිතියමේ පෙන්නුම් කරන්නේ විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජ්‍යය කොටස්වලට බෙදී ගිය අන්දමයි. එහි අංක 1, 2, 3 වශයෙන් පෙන්වා ඇති කොටස් නම් කරන්න.



(iii) පසු කාලයක සීතාවක රාජ්‍යයේ බලය වර්ධනය විය. එසේ වීමට බලපෑ කරුණු 2 ක් ගැන විස්තර ලියන්න.

04 (i) (a) දකුණු පස ඉදිරිපත් කර තිබෙන පින්තූරය කුමක් ද?



(b) එය නිර්මාණය කළ ශිල්පියා කවුරුන් ද?

(ii) පුනරුද අවධියේ යුරෝපා රටවල සිදුවූ නව විද්‍යාත්මක සොයාගැනීම් 4 ක් ලියන්න.

(iii) (a) එකල දේශ ගවේෂණ කටයුතුවල නිරත වූ පුද්ගලයින් දෙදෙනෙක් නම් කරන්න.

(b) එම පුද්ගලයින්ගේ දේශ ගවේෂණ කටයුතු ගැන වෙන වෙනම විස්තර ලියන්න.

05 (i) උඩරට රාජධානියේ පහත නම් සඳහන් නිලධාරීන්ට පැවරී තිබුණු කාර්යයන් එක බැගින් ලියන්න.

(a) ගජනායක නිළමේ (b) බත් වඩන නිලමේ

(ii) මහ අධිකාරම්වරුන්ට පැවරී තිබුණු රාජකාරි 2 ක් ලියන්න.

(iii) උඩරට රාජධානි සමයේ පහත සඳහන් කාර්යයන් හා සම්බන්ධ රජවරුන් නම් කරන්න.

(a) වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමීම.

(b) ගන්නෝරුව සටනින් පෘතුගීසීන් සමූලඝාතනය කිරීම.

(c) නායක්කර් වංශිකයින්ට උඩරට පාලන බලය ලැබීම.

(d) උඩරට රාජ්‍යයේ ආරම්භක පාලකයා වීම.

(e) මහනුවර දළදා මාළිගයක් කරවීම.

06 (i) යුරෝපා රටවල මධ්‍යතන යුගය අවසානයේ ඇතිවූ පුනරුදය යනු කුමක්දැයි අර්ථ දක්වන්න.

(ii) මධ්‍ය කාලීන අවධියේ යුරෝපා රටවල පැවැති තත්ත්වය පෙන්නුම් කරන කරුණු 2 ක් ලියන්න.